# 7 ශ්‍රේණිය

# දෙවන බස සිංහල

## ගුරු මාර්ගෝපදේශය

(2016 සිට ක්‍රියාත්මක වේ)


සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# දෙවන බස

# සිංහල

## ගුරු මාර්ගෝපදේශය

# 7 ශ්‍රේණිය

(2016 සිට ක්‍රියාත්මක වේ.)


සිංහල භාෂා දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

# දෙවන බස
# සිංහල
## ගුරු මාර්ගෝපදේශය

# 7 ශ්‍රේණිය

(2016 සිට ක්‍රියාත්මක වේ.)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව

භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

**දෙවන බස**
**සිංහල**

7 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2016

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN :.....................

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**මුද්‍රණය :**

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපෑල** : info@nie.lk

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

***ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව*** විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත් වන සහ එකොළොස් වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම්වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කර ගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදවු වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන් වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂය මාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | : | ඩබ්. පී. මංගල ගුණරත්න මහතා<br>සහකාර කථිකාචාර්ය |
| **විෂය විශේෂඥ සහාය** | : | රත්න විජේතුංග<br>මහාචාර්ය (විශ්‍රාම)<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br><br>තිස්ස ජයවර්ධන<br>මහාචාර්ය (විශ්‍රාම)<br>කොළඹ විශ්ව විද්‍යාලය |
| **ලේඛක මණ්ඩලය** | : | |

**අභ්‍යන්තර :**

| | | |
|---|---|---|
| ඩී. ඩබ්. දිසානායක මහත්මිය | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය |
| ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා | - | කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය |
| කේ. ඤාණවිමල හිමි | - | කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය |
| එම්. ජී. මුණසිංහ මහතා | - | කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය |
| ඩබ්. පී. මංගල ගුණරත්න මහතා | - | සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය |
| පී. ඒ. ඩී. රුවනි සිසිජා මහත්මිය | - | සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය |

**බාහිර :**

| | | |
|---|---|---|
| ආර්. ඒ. සුනීකා මහත්මිය | - | නියෝජ්‍ය කොමසාරිස් (විශ්‍රාමික) |
| පී. වී. සෙල්වරාජ් මහතා | - | විද්‍යාපීඨ කථිකාචාර්ය, (විශ්‍රාමික) |
| එච්. එල්. හරිස්චන්ද්‍ර මහතා | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ |
| ධම්මිකා කරල්ලියද්ද මෙනවිය | - | ගුරු සේවය |
| එම්. එච්. එම්. ෆාරුක් මහතා | - | ගුරු සේවය |
| පී. අශෝක් කුමාර් මහතා | - | ගුරු සේවය |

| | | |
|---|---|---|
| **භාෂා සංස්කරණය** | : | සිංහල භාෂා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විවිධ සහාය** | : | අනුලා නන්දනී රාජපක්ෂ මහත්මිය<br>නිලූපා අබේරත්න මහත්මිය<br>උපාලි ජයලත් මහතා |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ගුරු මාර්ගෝපදේශය ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ඵලදායීතාව වැඩි කිරීම සඳහා මග පෙන් වනු ලබයි. ගුරුවරයාට වඩාත් පහසුවෙන් නිපුණතාවත්, නිපුණතා මට්ටමත්, ඊට අදාළ පාඩමත් හඳුනා ගෙන ඉගැන්වීම් කාර්යයයේ නියැලීමට ඉඩ සැලසේ. ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේද, උපකරණ අමතර ක්‍රියාකාරකම් මෙහි අන්තර්ගත ව ඇත.

විශේෂයෙන් ම **සවන් දීම, කථනය, කියවීම, ලිවීම** යන චතුර්විධ භාෂා කුසලතා වර්ධනය මූලික වශයෙන් අපේක්ෂා කෙරේ. මෙහි දී භාෂණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් භාෂා හැකියා පුළුල් කිරීම සඳහා අවස්ථාව සලසා දී ඇත.

මෙහි **මූලික වදන්** මගින් පෙළ පොතේ පාඩමට අදාළ වාක් කෝෂය පෝෂණය කිරීමට වැඩි අවකාශයක් ලබා දී ඇත. ඒ සඳහා දරුවන්ගේ භාෂණ හැකියාව සංවර්ධනය කිරීමට **පුහුණුව** සඳහා යොදා ගත යුතු භාෂණ රටා ඇතුළත් කර තිබේ. ඒවා හැකිතාක් භාවිත කරමින් පන්ති කාමරයේ දී ශිෂ්‍යයන් කතා කරවීමට පෙලඹ විය යුතු ය. ඊට අදාළ ක්‍රියාකාරකම්හි වැඩි වැඩියෙන් නිරත කරවීම සඳහා ඔබගේ අත්දැකීම් ද පාදක කර ගනිමින් පන්ති කාමරයේ සිටින ශිෂ්‍යයන්ගේ මට්ටමට ගැළපෙන අයුරින් මෙම ක්‍රමවේද තවත් සරල කර ගනිමින් අවශ්‍ය අවස්ථාවල දී සංයුක්ත තැටි, හඬ පට, ගීත, ඡායාරූප, පින්තූර ආදි වඩාත් උචිත ක්‍රමවේද යොදා ගත හැකි ය. එසේ ම පාඩම් සැලසුම් සඳහා ලබා දී ඇති උපදෙස් ද සැලකිල්ලට ගෙන වඩාත් ආකර්ෂණීය ලෙස පාඩම් සැලසුම් කිරීමට ගුරුවරයාට අවස්ථාව සැලසෙනු ඇත.

මෙහි ඇති වඩාත් සුවිශේෂ කරුණ වන්නේ අදාළ පාඩම අවසානයේ ශිෂ්‍යයා අත් පත් කර ගත යුතු දේ ඉගෙනුම් පල ලෙස දක්වා තිබීමයි. එම කුසලතා ශිෂ්‍යයන්ගෙන් මතු කර ගැනීමට නිරතුරුව ම ඔබ වගබලා ගත යුතු ය. ඇගයීම් හා තක්සේරුකරණය සඳහා ලබා දී ඇති නිර්ණායක මගින් ශිෂ්‍යයන්ගේ ප්‍රබලතා හා දුබලතා හඳුනා ගෙන ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට හැකියාව ලැබේ. මෙම ගුරු මාර්ගෝපදේශය පරිශිලනය කරමින් ඔබේ අත්දැකීම ද ඒ සඳහා සුදුසු පරිදි යොදා ගෙන පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට මෙය මහෝපකාරී වනු ඇතැයි උදක් ම අපේක්ෂා කරමු.

ලේඛක මණ්ඩලය

# පටුන

| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| හැඳින්වීම | viii |
| ජාතික අරමුණු | ix-x |
| මූලික නිපුණතා | xi-xii |
| විෂයයේ අරමුණු | xiii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | xiv -xxxii |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01- 40 |

# හැඳින්වීම

සමාජය නො කැඩී නො බිඳී පවතින්නේ පුද්ගලයන් අතර පවතින හොඳහිත සහ සුහදතාව නිසා ය. එබැවින් සමාජය නො කැඩෙන සේ නො බිඳෙන සේ පවත්වා ගැනීමේ අරමුණ සාමාජිකයන් අතර දැඩි ලෙස පැවතිය යුතු ය. මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනීමට මූලාධාර වන්නේ මනුෂ්‍යයා සමාජ ගත වීම සඳහා යොදා ගන්නා ප්‍රබලතම උපකරණය වන භාෂාව යි.

ශ්‍රී ලංකාවේ පවතින භාෂා ප්‍රතිපත්තිය අනුව ප්‍රාථමික අවධියේ සිට සිංහල/දමිළ භාෂා දෙකින් එක් භාෂාවක් දෙවන බස ලෙස හැදෑරීම අනිවාර්ය ව පවතී. තම අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතියක් වශයෙන් භාෂා ප්‍රජාවක් ලෙස කටයුතු කිරීම මගින් සාධනීය ආකල්ප ගොඩනගා ගැනීමට මෙහි දී අවස්ථාව උදා කර දී ඇත. එය යථාර්ථයක් බවට පත් කරමින් භාෂාවක් භාවිත කිරීමට පුද්ගලයා සතු දෙයාකාර භාෂා ශක්‍යතා අතරින් භාෂණ ශක්‍යතාවට ප්‍රමුඛතාව දෙමින් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා දෙවන බස සිංහල විෂයමාලාව සැලසුම් කොට ඇත.

මේ සම්බන්ධයෙන් පසුගිය විෂයමාලා ප්‍රතිසංස්කරණ හා ඒ අනුසාරයෙන් සැකසුණු පන්ති කාමර ක්‍රියාවලිය පිළිබඳ සිදු කළ පර්යේෂණ අනාවරණයන් ද ලොව විවිධ රටවල භාවිත කෙරෙන බොහොමයක් විෂය නිර්දේශ ද අධ්‍යයනය කරන්නට යෙදුණි. එහි දී නොයෙක් පාර්ශවයන්ගේ අවධානයට බඳුන් වූ **"පොදු යුරෝපියානු ආදර්ශනය"** (The Common European Framework of Reference for Languages (CEFR) කෙරෙහි සැලකිල්ල යොමු විය. **එහි හරය සහ ආකෘතික** රාමුව ගැන විශේෂ යොමු වීමක් සිදු විය. එහි දී දැනට අප භාවිත කරන නිපුණතා ප්‍රවේශයට උදව් වන ලෙස හෙළ බසේ ගති සොබා හා හැඩරුව කෙරෙහි විශේෂත්වයක් දක්වමින් දෙවන බස සිංහල විෂයමාලාව සකසා ඇත.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යොන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003 දෙසැම්බර්)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා.
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්.
- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්,අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

| | | |
|---|---|---|
| ජෛව පරිසරය | : | සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා. |
| භෞතික පරිසරය | : | අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව |

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

## විෂයයේ අරමුණු

1. **ශබ්ද උච්චාරණ රටා**
ශබ්ද උච්චාරණ රටා, ශ්‍රවණ අත්දැකීම් සහ භාෂා රටා අනුකරණාත්මක ව හැසිරවීමේ හුරුව ඇති කර ගැනීම.

2. **ශ්‍රවණ සංයමය හා අවධානය**
විවිධතා හඳුනා ගනිමින් අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කිරීමේ ශක්තිය ඇති කර ගැනීම.

3. **ස්මරණය**
මතකය අවධි කර ගනිමින් අලුත් යමක් නිපදවීමේ ශක්තීන් ගොඩනගා ගැනීම.

4. **වින්දනය හා සුහදතාව**
අසා රස විඳිමින් ප්‍රසන්න සහ සුන්දර සිතිවිලි මගින් මානව දයාව, සුහදතාව ගොඩනැගීම.

5. **භාවිත රටා හුරුව**
භාෂා රීතිවලට අනුගත ව භාෂාව භාවිත කිරීමේ හුරුව සහ සිංහල අත් අකුරු නිවැරදි ව, ක්‍රමවත් ව, පැහැදිලි ව ලිවීමේ හුරුව ඇති කර ගැනීම.

6. **වාක්කෝෂ හැකියාව**
බස්වහර හඳුනා ගනිමින් අන්තර්ගත වචන රැස් කරමින් ඒවා සුදුසු ලෙස භාවිත කිරීමේ හුරුව ඇති කර ගැනීම.

7. **ආකල්ප ගොඩනැගීම**
උත්සව අවස්ථා, සිරිත් විරිත්, පරිභෝජන රටා, ගණන් මිනුම් පිළිබඳ හෙළබසේ ගති සොබා අනුව සිංහල සංස්කෘතියෙහි හැඩරුව හඳුනා ගනිමින් සමාජ සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමට දායක වීම.

8. **විෂය නිර්දේශයේ අරමුණු**
   - විවිධ ප්‍රායෝගික කාර්යයන් ඉටුකර ගැනීම සඳහා භාෂා සම්මතයන්ට (රීති) අනුව භාෂා භාවිතය පිළිබඳ ව හුරුව ලබා ගැනීම.
   - සංස්කෘතිය හා සංස්කෘතික උරුමයන්, දායාද, වටිනාකම් හා අගයයන් පිළිබඳ දැනුම හා අවබෝධය ඇති කර ගනිමින් අභිමානවත් ශ්‍රී ලාංකේය ජාතියක් ගොඩනැගීම සඳහා යහපත් ආකල්ප හා පුරුදු සංවර්ධනය කර ගැනීම.
   - පුරවැසියෙකු ලෙස සියලු ප්‍රතිලාභ අත්විඳීම උදෙසා දේශීය වශයෙන් වෘත්තීය ප්‍රස්තාවන් සඵල කර ගැනීම සඳහා භාෂා ප්‍රවීණතාවක් ඇති කර ගැනීම.

# දෙවන බස සිංහල

## විෂය නිර්දේශය

## 7 ශ්‍රේණිය

(2016 සිට ක්‍රියාත්මක වේ)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

:www nie.lk

## 1.0 හැඳින්වීම

සමාජය නො කැඩී නො බිඳී පවතින්නේ පුද්ගලයන් අතර පවතින හොඳහිත සහ සුහදතාව නිසා ය. එබැවින් සමාජය නො කැඩෙන සේ නො බිඳෙන සේ පවත්වා ගැනීමේ අරමුණ සාමාජිකයන් අතර දැඩි ලෙස පැවතිය යුතු ය. මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනීමට මූලාධාර වන්නේ මනුෂ්‍යයා සමාජගත වීම සඳහා යොදා ගන්නා ප්‍රබලතම උපකරණය වන භාෂාව යි.

ශ්‍රී ලංකාවේ පවතින භාෂා ප්‍රතිපත්තිය අනුව ප්‍රාථමික අවධියේ සිට සිංහල/දමිළ භාෂා දෙකින් එක් භාෂාවක් දෙවන බස ලෙස හැදෑරීම අනිවාර්ය ව පවතී. තම අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතියක් වශයෙන් භාෂා ප්‍රජාවක් ලෙස කටයුතු කිරීම මගින් සාධනීය ආකල්ප ගොඩනගා ගැනීමට මෙහි දී අවස්ථාව උදා කර දී ඇත. එය යථාර්ථයක් බවට පත් කරමින් භාෂාවක් භාවිත කිරීමට පුද්ගලයා සතු දෙයාකාර භාෂා ශක්‍යතා අතරින් භාෂණ ශක්‍යතාවට ප්‍රමුඛතාව දෙමින් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා දෙවන බස සිංහල විෂයමාලාව සැලසුම් කොට ඇත.

මේ සම්බන්ධයෙන් පසුගිය විෂයමාලා ප්‍රතිසංස්කරණ හා ඒ අනුසාරයෙන් සැකසුණු පන්ති කාමර ක්‍රියාවලිය පිළිබඳ සිදු කළ පර්යේෂණ අනාවරණයන් ද ලොව විවිධ රටවල භාවිත කෙරෙන බොහොමයක් විෂය නිර්දේශ ද අධ්‍යයනය කරන්නට යෙදුණි. එහි දී නොයෙක් පාර්ශවයන්ගේ අවධානයට බඳුන් වූ **"පොදු යුරෝපියානු ආදර්ශනය"** (The Common European Framework of Reference for Languages (CEFR) කෙරෙහි සැලකිල්ල යොමු විය. **එහි හරය සහ ආකෘතික රාමුව** ගැන විශේෂ යොමු වීමක් සිදු විය. එහි දී දැනට අප භාවිත කරන නිපුණතා ප්‍රවේශයට උදවු වන ලෙස හෙළ බසේ ගති ස්වභාවය හා හැඩරුව කෙරෙහි විශේෂත්වයක් දක්වමින් දෙවන බස සිංහල විෂයමාලාව සකසා ඇත.

## 2.0 ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව 2003 දෙසැම්බර්)

## 3.0 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

(II) පෞරුෂ වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා.

- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්.

- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදිතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

## විෂය අරමුණු

1. **ශබ්ද උච්චාරණ රටා**
ශබ්ද උච්චාරණ රටා, ශ්‍රවණ අත්දැකීම් සහ භාෂා රටා අනුකරණාත්මක ව හැසිරවීමේ හුරුව ඇති කර ගැනීම.

2. **ශ්‍රවණ සංයමය හා අවධානය**
විවිධතා හඳුනා ගනිමින් අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කිරීමේ ශක්තිය ඇති කර ගැනීම.

3. **ස්මරණය**
මතකය අවධි කර ගනිමින් අලුත් යමක් නිපදවීමේ ශක්තිය ගොඩනගා ගැනීම.

4. **වින්දනය හා සුහදතාව**
අසා වින්දනයක් ලබමින් ප්‍රසන්න සහ සුන්දර සිතිවිලි මගින් මානව දයාව සහ සුහදතාව ගොඩනැගීම.

5. **භාවිත රටා හුරුව**
භාෂා රීතිවලට අනුගත ව භාෂාව භාවිත කිරීමේ හුරුව සහ සිංහල අත් අකුරු නිවැරදි ව, ක්‍රමවත් ව, පැහැදිලි ව ලිවීමේ හුරුව ඇති කර ගැනීම.

6. **වාක්කෝෂ හැකියාව**
බස්වහර හඳුනා ගනිමින්, අන්තර්ගත වචන රැස් කරමින් ඒවා සුදුසු ලෙස භාවිත කිරීමේ හුරුව ඇති කර ගැනීම.

7. **ආකල්ප ගොඩනැගීම**
උත්සව අවස්ථා, සිරිත් විරිත්, පරිභෝජන රටා, ගණන් මිනුම් පිළිබඳ හෙළ බසේ ගති ස්වභාවය අනුව සිංහල සංස්කෘතියෙහි ස්වරූපය හඳුනා ගනිමින් සමාජ සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමට දායක වීම.

8. **විෂය නිර්දේශයේ අරමුණු**

- විවිධ ප්‍රායෝගික කාර්යයන් ඉටුකර ගැනීම සඳහා භාෂා සම්මතයට (රීති) අනුව භාෂා භාවිතය පිළිබඳ ව පරිචය ලබා ගැනීම.
- සංස්කෘතිය හා සංස්කෘතික දායාද, වටිනාකම් හා අගයයන් පිළිබඳ දැනුම හා අවබෝධය ඇති කර ගනිමින් අභිමානවත් ශ්‍රී ලාංකේය ජාතියක් ගොඩනැගීම සඳහා යහපත් ආකල්ප හා පුරුදු සංවර්ධනය කර ගැනීම.
- පුරවැසියෙකු ලෙස සියලු ප්‍රතිලාභ අත් විඳීම උදෙසා දේශීය වශයෙන් වෘත්තීය ප්‍රස්තාවන් සඵල කර ගැනීම සඳහා භාෂා ප්‍රවීණතාවක් ඇති කර ගැනීම.

## பாடத்தின் நோக்கம்

1. ஒலி ஒலிப்பு முறைகள்

ஒலி ஒலிப்பு முறைகள் செவிமடுத்தல் அனுபவங்கள் மற்றும் மொழி வடிவங்கள் போன்றவற்றை பின்பற்றிப் பயன்படுத்தும் பயிற்சியை ஏற்படுத்திக் கொள்ளல்.

2. செவிமடுத்தலும் அவதானித்தலும்

ஒலி வேறுபாடுகளை இனங்கண்டு கிரகித்து வெளிப்படுத்தும் திறனை ஏற்படுத்திக் கொள்ளல்.

3. ஞாபகம்

ஞாபகத்தைத் தூண்டிப் புத்தாக்கம் ஒன்றை உருவாக்கும் சக்தியை கட்டியெழுப்பல்.

4. நயத்தலும் நட்புப் பேணுதலும்

கேட்டு நயப்பதால் மனதில் ஏற்படும் மகிழ்ச்சி மற்றும் சீரிய சிந்தனைகள் மூலம் மனிதாபிமானம் புரிந்துணர்வு நட்புறவு என்பவற்றை கட்டியெழுப்புதல்.

5. பிரயோக முறைகள்

மொழி மரபுகளுக்கேற்ப மொழியைப் பயன்படுத்தும் திறனையும் சிங்கள மொழி எழுத்துக்களை எழுதும் பொறி முறைகளையும் அறிந்து கொள்ளல்.

6. சொற் களஞ்சியப் பெருக்கம்

மொழியை இனங்கண்டு அதிலுள்ள சொற்களை உள்வாங்கி அவற்றை பொருத்தமான முறையில் பிரயோகித்தல்.

7. நடத்தை மாற்றம்

விழாக்கள், சடங்குகள், சம்பிரதாயங்கள், சமூகப்பண்பாட்டுக் கோலங்கள் போன்றவற்றை இனங்கண்டு இன ஐக்கியத்தைப் பலப்படுத்துவதற்கு பங்காற்றுதல்.

8. பாடத்திட்டத்தின் நோக்கங்கள்

- பலவிதமான பிரயோகச் செயற்பாடுகளை நிறைவேற்றிக் கொள்வதற்காக மொழி மரபுகளுக்கு அமைவாக மொழிப்பயன்பாட்டுப் பழக்கத்தை உருவாக்கிக்கொள்ளல்.
- கலாச்சாரம், கலாச்சாரச் சின்னங்கள், பெறுமானங்கள் பற்றிய அறிவைப் பெற்று நன்மதிப்புள்ள இலங்கையர் சமூகத்தை உருவாக்குவதற்காக உயர்ந்த சிந்தனை களையும் பழக்கங்களையும் விருத்தி செய்து கொள்ளல்.
- நாட்டின் குடிமகனாக அனைத்துப் பயன்களையும் ஈட்டிக் கொள்வதற்காக தேசிய மட்டத்தில் தொழில் வாய்ப்பொன்றைப் பெறுவதற்கு அவசியமான மொழித்திறனை விருத்தி செய்து கொள்ளல்.

# දෙවන බස සිංහල
# විෂය නිර්දේශය
# 7 ශ්‍රේණිය

| සවන් දීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| 1.0<br>එදිනෙදා පොදු අවස්ථා හා සිදු විය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් මැනවින් ගළපා සැකසූ පාඨවලට (Texts) සවන් දෙමින්, ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි. | 1.1<br>සුහද කතාබහට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි. | ▪ සති අන්ත නිවාඩුවට කළ දේ<br>(සීයා බලන්න යාම.)<br>வார இறுதி விடுமுறையில் செய்தவை<br>(தாத்தாவை பார்க்க சென்றமை)<br><br>ආච්චි<br>සීයා<br>ලොකු අම්මා<br>පුංචි අම්මා<br>බාප්පා<br><br>තිබ්බටු<br>කොස්<br>කජු<br>ඇළ<br><br>කනවා.<br>නානවා.<br>සෙල්ලම් කරනවා.<br>නිදා ගන්නවා.<br>පාඩම් කරනවා.<br><br>කොහොම ද? | • අවධානයෙන් සවන් දී සුහද කතාබස්වල තොරතුරු හඳුනා ගෙන කියයි.<br><br>• කතා බහේ ඇතුළත් සිද්ධිය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br><br>• අලුත් වචන භාවිත කරමින් සුහද කතා බහේ යෙදෙයි. | 04 |

| සවන් දීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 1.2<br>උපදෙස්වලට සවන් දෙයි.<br>ප්‍රතිචාර දක්වයි. | ▪ පාසලට යන අතරතුර දී පිළිපැදිය යුතු උපදෙස්<br>பாடசாலைக்கு செல்லும் வழியில் பின் பற்ற வேண்டிய அறிவுறுத்தல்கள்.<br><br>පුතා<br>දුව<br>මාමේ<br>ආච්චි<br>අම්මා<br><br>ටිකට් එකක්<br>බස් එකෙන්<br>බෑග් එක<br>කහ ඉරෙන්<br><br>නගින්න.<br>ගන්න.<br>අල්ල ගන්න.<br>ඉඩ දෙන්න.<br>ගලවන්න.<br>පාර මාරු වෙන්න.<br>දකුණු පැත්තෙන් ගමන් කරන්න. | • උපදෙස් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• උපදෙස්වලට වාචික ප්‍රතිචාර දක්වයි<br>• උපදෙස් අනුව කටයුතු කරයි. | 03 |

| සවන් දීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 1.3<br>යමක් පිළිබඳ විමසීම්වලට හා මග විමසුම්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි. | ▪ විදුහල්පතිතුමා හමුවීමට එන අයෙක්, කාර්යාලය විමසන අවස්ථාවකට සවන් දීම.<br>பாடசாலை அதிபரை சந்திக்க வரும் ஒருவர் காரியாலயத்தை பற்றி வினவுகின்ற சந்தர்ப்பமொன்றை செவி மடுத்தல்.<br>විදුහල්පති තුමා<br>පුතා/දුව<br>මට<br>මම<br><br>ආවේ<br>හම්බ වෙන්න ඕනෑ.<br>ඉන්නේ කොහේ ද?<br>කාර්යාලය<br>තියෙන්නේ කොහේ ද?<br>(මට විදුහල්පති තුමා හම්බවෙන්න ඕනෑ.)<br>(කාර්යාලයට යන්න පාර කියන්න.) | • මග විමසීම් අවස්ථාව තේරුම් ගෙන ප්‍රකාශ කරයි.<br>• මග විමසම්වල දී භාවිත වචන හඳුනා ගෙන කියයි.<br>• මග විමසීම්වල දී නිවැරදි ප්‍රතිචාර දක්වයි. | 04 |

| සවන් දීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 1.4<br>නිවේදනවලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි. | ▪ නැටුම් හා සංගීත පන්තිවලට සහභාගි වන ශිෂ්‍යයන්ට කෙරෙන නිවේදනයක්<br>சங்கீத, நடன வகுப்புக்களில் கற்கும் மாணவர்களுக்கு விடுக்கப்படும் ஓர் அறிவித்தல்.<br><br>කරුණාවෙන් සවන් දෙන්න.<br>නිවේදනය<br>ශ්‍රේණිවල<br>ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට<br>ලබන සතියේ<br>පැවැත්වෙන<br>පාසල් ක්‍රීඩා උත්සවය<br>පිළිගැනීමේ නැටුම<br>සහභාගි වන<br>ප.ව. 2.00 ට<br>ප්‍රධාන ශාලාවට<br>පැමිණෙන්න. | • සවන් දුන් නිවේදනයේ ඇතුළත් පණිවිඩය ප්‍රකාශ කරයි.<br>• නිවේදනයේ ඇතුළත් අලුත් වචන හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිවේදනවලට අනුව කටයුතු කරයි. | 03 |

| සවන් දීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 1.5<br>ගුවන්විදුලි ප්‍රචාර හා පටිගත කිරීම්වලට සවන් දෙයි. රස විඳියි. | ■ සරල ළමා ගීතයක්<br>சிறுவர்களுக்கான எளிமையான பாடலொன்று<br>තාරකා<br>දිලිහි දිලිහි<br>ආකාසේ<br>බබළන මල්<br>තාරකා<br><br>බැබළී බැබළී<br>අකාසේ<br>දිලිහෙන මල්<br>තාරකා<br><br>කළුවර රෑ<br>ආකාසේ<br>හිනහ වේවී<br>තාරකා<br><br>ගන්ටත් බෑ<br>දෙන්ටත් බෑ<br>පුංචි රුවන්<br>තාරකා<br><br>පද රචනය - ආනන්ද රාජකරුණා | • ගීතයෙන් ප්‍රකාශිත අවස්ථාව පැහැදිලි කරයි.<br>• ගීතයට සවන් දෙමින් ගායනා කරයි.<br>• ගීතය ගායනා කරමින් රස විඳියි. | 04 |

| කථනය | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| 2.0<br>පොදු, සිදුවිය හැකි හා කාල්පනික, විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි. | 2.1<br>**උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි.** | • අසල් වැසියන් සමග එක් වී ගොයම් කපන අවස්ථාවක්<br><br>அயலவர்களுடன் ஒன்று சேர்ந்து அருவி வெட்டும் சந்தர்ப்பம்<br><br>- නැන්දා<br>- මාමා<br>- බාප්පා<br>- පුංචි අම්මා<br><br>- කුඹුර<br>- ගොයම්<br>- නියර<br>- කමත<br>- මඩ<br>- වතුර<br>- කරල<br>- දෑකැති<br>- තේ වතුර<br>- කෑම<br><br>- එන්න.<br>- කපන්න.<br>- එකතු කරන්න.<br>- ගෙනි යන්න.<br>- අඬ ගහන්න.<br>- යන්න එපා.<br>- බහින්න එපා.<br><br>- එකක් - දෙකක්<br>- එක්කෙනෙක්<br>- දෙන්නෙක්<br><br>- උදේට, දවල්ට/සවසට | • උපදෙස් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br><br>• උපදෙස්වලට වාචික ප්‍රතිචාර දක්වයි.<br><br>• උපදෙස් අනුව කටයුතු කරයි. | 04 |

| කථනය | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | **2.2**<br>මග විමසීම්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි. | • විදුහල්පතිතුමා හමුවීමට එන කෙනෙකුට කාර්යාලයට යාමට උදව් කිරීම.<br>(பாடசாலை அதிபரை சந்திக்க வரும் ஒருவருக்கு காரியாலயத்துக்கு போவதற்கு உதவுதல்.)<br>ටිකක් වෙලා ඉන්න.<br>ඉස්සරහට යන්න.<br>මෙතනින්<br>අඹ ගහ<br>ළඟින්<br>දකුණට/වමට<br>හැරෙන්න<br>කෙළින් ම<br>යන කොට<br>තියෙන්නේ<br>විදුහල්පතිතුමා<br>ගුරුතුමිය<br>ආරාධනා පත්‍රයක් | • මග විමසීම් අවස්ථා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• මග විමසීම්වල දී භාවිත වචන හඳුනා ගෙන කියයි.<br>• මග විමසීම්වලට නිවැරදි ප්‍රතිචාර දක්වයි. | 04 |
| | 2.3<br>සුහද සංවාදවල දී මැදිහත් වෙයි. | • යහළුවන් දෙදෙනෙකු අතර කෙරෙන කතාවට මැදිහත් වීම.<br>நண்பர்கள் இருவருக்கு இடையில் நடைபெறுகின்ற உரையாடலின் கலந்து கொள்வர்.<br>කවු ද?<br>කාට ද?<br>මොකක් ද?<br>කීයට ද?<br>ඇයි?<br>කොහෙ ද?<br>ගන්නවා.<br>දෙනවා.<br>ගියා.<br>ආවා.<br>බැලුවා.<br>දුන්නා.<br>ගත්තා. | • සුහද සංවාදවල දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• සුහද සංවාදවල දී ප්‍රශ්න අසයි.<br>• සංවාදවලට සහභාගීවෙමින් ප්‍රතිචාර දක්වයි. | 04 |

| කථනය | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 2.4<br>තොරතුරු හුවමාරු කිරීමේ දී මැදිහත් වෙයි. | • උත්සවයකට යාමට සූදානම් වීමක් (නැන්දලා අලුත් නිවසකට පදිංචියට යාම)<br>வைபவமொன்றுக்கு போவதற்கு ஆயத்த மாகுதல்.<br>(மாமியார், புதுவீட்டுக்கு குடி புகுதல்)<br><br>නැන්දා<br>මාමා<br>බාප්පා<br>පුංචි අම්මා<br><br>අලුත් නිවස, තෑග්ග<br>පිත්තල පහනක්<br><br>ලෑස්ති වෙන්න.<br>ඉක්මන් කරන්න.<br>හයට යනවා.<br><br>ලස්සන යි.<br>සන්තෝස යි/සතුටු යි. | • සිද්ධියට අදාළ තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• තොරතුරු දැන ගැනීම සඳහා මැදිහත් වී කටයුතු කරයි.<br>• තොරතුරු හුවමාරු කර ගනිමින් අදහස් ප්‍රකාශ කරයි. | 04 |

| කථනය | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 2.5<br>ගනුදෙනුවල දී මැදිහත් වෙයි. | • උත්සවයක සංග්‍රහයක් සඳහා අවශ්‍ය දෑ බෙදා ගැනීම.<br>வைபவமொன்றின் உபசரிப்புக்காக தேவைப்படும் பொருட்களையும் சிற்றுண்டிகளையும் பகிர்ந்து கொள்ளல்.<br>ඔයා<br>මෙයා<br>අරයා<br>කැවුම්<br>කොකිස්<br>දොදොල්<br>අලුවා<br>පිඟන්<br>කෝප්ප<br>හදනවා<br>හදන්න<br>ගේන්න<br>පලතුරු බීම | • ගනුදෙනු අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• ගනුදෙනු අවස්ථාවල භාවිත වචන හඳුනා ගෙන කියයි.<br>• සරල ගනුදෙනුවලට සහභාගි වෙමින් මැදිහත් වී කටයුතු කරයි. | 04 |

| කථනය | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| 2.0<br>පොදු සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතා බස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගි ව කටයුතු කරයි. | **2.6**<br>**කෙටි සරල වාචික ප්‍රකාශන ඉදිරිපත් කරයි.** | • **මම කැමති විනෝදාංශය**<br>**நான் விரும்பும் பொழுதுபோக்கு**<br><br>රූපවාහිනි නැරඹීම<br>කතන්දර<br>සත්තු<br>වනාන්තර<br>ළමා වැඩසටහන්<br>බලන්න.<br>කියවන්න.<br>එකතු කරන්න.<br>කියන්න.<br><br>මං කැමති යි.<br>මං ආස යි. | • තමා කැමති විනෝදාංශය නම් කරයි.<br><br>• මාතෘකාවට අදාළ ව කරුණු පෙළ ගස්වා කියයි.<br><br>• කෙටි වාචික ඉදිරිපත් කිරීමක් කරයි. | **04** |

| කියවීම හා නැරඹීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| 3.0<br>එදිනෙදා පොදු මෙන් ම සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන ද සමීප හා නුහුරු කතා බස්වලින් සැකසුණු විවිධ පාඨ (Texts) අවබෝධයෙන් කියවා **ප්‍රතිචාර දක්වමින්** ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි. | 3.1<br>**ලිපි හා වෙනත් ලේඛන කියවයි. නරඹයි.** | • **ආච්චිගෙන් ලිපියක්. (තොරතුරු කිහිපයක්)**<br>பாட்டியிடமிருந்து கிடைக்கப்பெற்ற கடிதமொன்று (சில தகவல்கள்)<br><br>ඇළ<br>මාලු<br>කන්දෙ විහාරය<br>රඹුටන්<br>පේර<br>කුඹුර<br><br>සැප සනීප කොහොම ද?<br>නිවාඩුයි<br>අද<br>හෙට<br>අනිද්දා | • ලිපි කියවා සරල අදහස කියයි.<br>• ලිපියේ ඇතුළත් තොරතුරු කියවා ප්‍රකාශ කරයි.<br>• සරල ලිපියක් කියවයි.<br>• වෙනත් ලේඛන කියවයි. | 03 |

| කියවීම හා නැරඹීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 3.2<br>සාහිත්‍යයික පාඨ කියවයි. නරඹයි. | ▪ සරල ළමා ගීතයක්<br>சிறுவர்களுக்கான எளியநடை பாடலொன்று<br><br>තාරකා<br><br>දිලිහි දිලිහි<br>ආකාසේ<br>බබළන මල්<br>තාරකා<br><br>බැබළී බැබළී<br>අකාසේ<br>දිලිහෙන මල්<br>තාරකා<br><br>කළුවර රෑ<br>ආකාසේ<br>හිනහා වේවී<br>තාරකා<br><br>ගන්ටත් බෑ<br>දෙන්ටත් බෑ<br>පුංචි රුවන්<br>තාරකා<br><br>පද රචනය - ආනන්ද රාජකරුණා | • පද්‍ය ගායනා කිරීමේ හුරුව ලබයි.<br><br>• පද්‍ය පන්තිය ගායනා කරයි.<br><br>• පද්‍ය පන්තිය ගායනා කරමින් රස විඳියි. | 03 |

| කියවීම හා නැරඹීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 3.3<br>උපදෙස් කියවයි. නරඹයි. | • ගොයම් කපන අවස්ථාවක දෙන උපදෙස්<br>அருவி வெட்டப்படுகின்ற சந்தர்ப்பமொன்றில் கொடுக்கப்படுகின்ற அறிவுரைகள்<br>නියර<br>දෑ කැත්ත<br>කමත<br>කැවිලි<br>වතුර<br>තේ වතුර<br>අල්ලන්න<br>බෙදන්න<br>මිටි බඳින්න | • උපදෙස් සහිත වැකි හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• උපදෙස් සහිත වැකි කියවයි.<br>• උපදෙස් කියවා ඒ අනුව කටයුතු කරයි. | 02 |

| කියවීම හා නැරඹීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 3.4<br>ශ්‍රව්‍ය දෘශ්‍ය පාඨ හා වෙනත් මාධ්‍ය තොරතුරු කියවයි. නරඹයි. | • එදිනෙදා දක්නට ලැබෙන උපදෙස් සහිත දැන්වීම් කියවීම.<br>அன்றாடமும் காணப்படுகின்ற அறிவித்தல் பலகைகளில் உள்ள அறிவித்தல்களை வாசித்தல்.<br><br>මෙහි<br>කුණු<br><br>දකුණු පැත්තෙන්<br><br>කහ ඉරෙන්<br><br>නිශ්ශබ්ද වන්න<br><br>ජලය බීමට පමණයි<br><br>දමන්න එපා.<br>වාහන නවතා තැබීම තහනම්.<br>ගමන් කරන්න.<br>පාර මාරු වෙන්න. | • මග තොටේ දක්නට ලැබෙන දැන්වීම් කියවයි.<br>• පින්තූර සහිත දැන්වීම් කියවයි.<br>• දැන්වීම් කියවා අදාළ ප්‍රතිචාර දක්වයි. | 03 |

| ලිවීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| 4.0<br>පොදු, සිදුවිය හැකි සහ කාල්පනික අවස්ථා ගැන විවිධ භාෂා රටාවලින් යුක්ත කෙටි සරල වාක්‍ය ලියයි. | 4.1 විස්තර පාඨ ලියයි. | • පාසල් පරිසරය ඇසුරින් සරල වාක්‍ය ලිවීම.<br>பாடசாலை சுற்றாடலில் காணப்படுவன வற்றைப் பற்றி இலகுவான வசனங்கள் எழுதுதல்.<br><br>මම<br>ඔයා<br>අපි<br>ගුරුතුමිය<br><br>පන්තිය<br>පාසල<br>පිට්ටනිය<br><br>ලියනවා.<br>දුවනවා.<br>නගිනවා.<br>කැඩෙනවා. | • පාසල් පරිසරයේ භාවිත වචන හඳුනා ගෙන ලියයි.<br>• සරල වාක්‍ය ගොඩනගා ඉදිරිපත් කරයි.<br>• පාසල් පරිසරය ඇසුරෙන් සරල වාක්‍ය ලියයි. | 04 |

| ලිවීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 4.2<br>නිර්මාණාත්මක පාඨ ලියයි. | • මම කැමති විනෝදාංශය<br>நான் விரும்பும் பொழுதுபோக்கு<br><br>මං ආසයි.<br>මං කැමතියි.<br>සින්දු කියන්න.<br>නටන්න.<br>කියවන්න.<br>බලන්න. | • තමා කැමති විනෝදාංශය නම් කරයි.<br>• තම විනෝදාංශ පිළිබඳ වාක්‍ය ලියයි.<br>• තම විනෝදාංශ පිළිබඳ නිර්මාණාත්මක පාඨ ලියයි. | 03 |
| | 4.3<br>ලිපි ලියයි. | ආච්චිට ලිපියක්<br>பாட்டிக்கு ஓர் கடிதம்<br>ලිපිනය<br>දිනය<br><br>සෙත්වේවා!<br><br>සුදු ආච්චි වෙතටයි,<br>එවූ ලිපිය ලැබුණා. අපට බොහොම සතුටුයි. ලබන සුමානෙ අපි එනවා. අම්මායි තාත්තයි අපි එක්ක එනවා. එතකොට කන්දේ පන්සල අපට බලන්න පුළුවන්. අපිට කන්න රඹුටන් කඩල තියන්න. ආච්චිට දෙවිපිහිටයි.<br>මීට<br><br>ආදරණීය චූටි පුතා | • සරල ලිපියක ආකෘතිය හඳුනා ගෙන ලියයි.<br>• පෞද්ගලික ලිපි ලිවීමේ හුරුව ලබයි.<br>• පෞද්ගලික ලිපි ලියයි. | 04 |

**ලිවීම**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 4.4<br>තොරතුරු සහිත පාඨ ලියයි. | • නත්තල් උත්සවයකට සහභාගි වීම.<br>நத்தார் பண்டிகையில் கலந்து கொள்ளல்.<br><br>නත්තල් උත්සවය<br><br>නත්තල් ගස<br>නත්තල් සීයා<br>තෑගි<br>දිග රැවුලක්<br>රතු ඇඳුම<br>සුදු රැවුලක්<br><br>ඉපදුණා.<br>උපන්නා.<br>හදනවා.<br>සමරනවා.<br>සරසනවා.<br><br>සුදු පාටයි.<br>රතු පාටයි.<br>ලස්සනයි. | • තොරතුරු හඳුනා ගෙන ලියයි.<br>• තොරතුරු ඇසුරෙන් සරල වාක්‍ය ලියයි.<br>• අවස්ථාවට ගැළපෙන පරිදි තොරතුරු ලියා දක්වයි. | 04 |

## 7 ශ්‍රේණිය
## භාෂා අන්තර්ගතය

1.1 කනවා කෑවා
බොනවා බිව්වා/බීවා

1.2 (කහ) ඉරෙන්
පැත්තෙන්
ඉස්සරහින් (බස්) එකක්

1.3 ඉන්නේ කොහෙද?
යන්නේ

1.4 කරුණාවෙන් සවන් දෙන්න.
අද, හෙට, අනිද්දා
දවල්, හවස, රාත්‍රී

1.5 දිලිහි දිලිහි - දිලිහෙන
බැබළි බැබළි - බබළන
ගන්නටත් බෑ
දෙන්ටත් බෑ

2.1 යන්න - යන්න එපා.
එකතු කරන්න - එකතු කරන්න එපා.
(උදේ) ට, (දවල්) ට, (හවස) ට

2.2 ඉන්න බෑ.
ටිකක් ඉන්න.
පොඩ්ඩක් ඉන්න.

2.3 ඕනෑ { කාට ද? / කවදා ද? / මොකක් ද? }

2.4 ලස්සනයි. සන්තෝසයි.
මාමට
නැන්දට
අපට

2.5 ඔයා අතන
මෙයා මෙතන
අරයා එතන

2.6 මං ආසයි.
මං කැමතියි.

3.1 දෙවි පිහිටයි. නිවාඩුයි - නිවාඩු ද? කොහොම ද?
ආදරණීය,
නිරෝගි
සැප සනීප පුතාගේ - දුවගේ, ආච්චිගේ

3.2 දිලිහි දිලිහි - දිලිහෙන
බැබළි බැබළි - බබළන
ගන්නටත් බෑ
දෙන්ටත් බෑ

3.3 (තේ) අල්ලන්න (මිටි) බඳින්න. ගහන්න, කරන්න, ගෙනියන්න.

3.4 (කුණු) දමන්න එපා. <u>පැත්තෙන්</u> යන්න (බීමට) පමණි
දුවන්න එපා. <u>කහ ඉරෙන්</u> මාරුවෙන්න.

4.1 මම / ඔයා / අපි / ගුරුතුමිය } (පිට්ටනිය)ට / (පන්තිය)ට } යනවා

4.2. මම කැමතියි - මං කැමැතියි
මම ආසයි - මං ආසයි

4.3 සෙත් වේවා.
නිදුක් වේවා.
නිරෝගි වේවා.
තේරුවන් සරණයි.

4.4 නිසා සැරසුවා
හුඟක් දුන්නා
ගොඩක්

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

- සවන්දීම
- කථනය
- කියවීම හා නැරඹීම
- ලිවීම

## සවන් දීම

**නිපුණතාව** 1.0 : එදිනෙදා පොදු අවස්ථා හා සිදු විය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් j yrl ks auek úk a. <md i el i qmdGj , g (Texts) සවන් දෙමින්, ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම** 1.1 : සුහද කතාබහට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල**

- අවධානයෙන් සවන් දී සුහද කතාබස්වල තොරතුරු හඳුනා ගෙන කියයි.
- කතාබහේ ඇතුළත් සිද්ධිය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අලුත් වචන භාවිත කරමින් සුහද කතාබහේ යෙදෙයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- අදාළ පාඩම තෝරා ගන්න.
- පාඩමට සවන් දීම සඳහා සුදුසු ක්‍රමයක් යොද ගන්න.
- පාඩම කිහිප වරක් සවන් දීමට සලස්වන්න.
- පාඩමේ ඇති දෙබස් නිවැරදි ව සවන් දීමට යොමු කරන්න.
- මූලික වදන්වලට අවධානය යොමු කරවන්න.
- පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්න.
- පෙළ පොතේ පාඩමට අදාළ අභ්‍යාස කරවන්න.

**මූලික වදන් :**

- **සීයා බලන්න යාම**

| | |
|---|---|
| ආච්චි | |
| සීයා | කනවා |
| ලොකු අම්මා | බොනවා |
| පුංචි අම්මා | නානවා |
| බාප්පා | කඩනවා |
| තිබ්බටු | උයනවා |
| කොස් | |
| කජු | |
| ඇළ | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

| | |
|---|---|
| **කනවා** | **කෑවා** |
| බත් කනවා. | බත් කෑවා. |
| අඹ කනවා. | අඹ කෑවා. |
| කොස් කනවා. | කොස් කෑවා. |
| **බොනවා.** | **බිවුවා/බීවා** |
| වතුර බොනවා. | වතුර බිවුවා. |
| තැඹිලි බොනවා. | තැඹිලි බිවුවා. |
| තේ බොනවා. | තේ බිවුවා. |

**ගුණාත්මක යෙදවුම් :**

- පෙළ පොතේ පාඩමට අදළ ව සකස් කර ගත් හඬ පටයක් .

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- සවන් දුන් අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අන්තර්ගතයේ ඇතුළත් වචන හඳුනා ගෙන කියයි.
- අසන ලද ප්‍රශ්නවලට ප්‍රතිචාර දක්වයි .

වචන මාලාව

| | | |
|---|---|---|
| ආච්චි | - | பாட்டி |
| සීයා | - | தாத்தா/பாட்டன் |
| ලොකු අම්මා | - | பெரியம்மா |
| පුංචි අම්මා | - | சித்தி சின்னம்மா |
| බාප්පා | - | சித்தப்பா |
| තිබ්බටු | - | சுண்டக்காய் |
| කොස් | - | பலாக்காய் |
| කජු | - | மரமுந்திரிகை |
| ඇළ | - | கால்வாய் |
| කනවා | - | சாப்பிடறன் |
| බොනවා | - | குடிக்கிறன் |
| නානවා | - | குளிக்கிறன் |
| සෙල්ලම් කරනවා | - | விளையாடுறன் |
| පනිනවා | - | பாய்றன் |
| උයනවා | - | சமைக்கிறன் |
| කොහොම ද? | - | எப்படி |

## සවන් දීම

**නිපුණතාව 1.0 :** එදිනෙදා පොදු අවස්ථා හා සිදු විය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් මැනවින් ගළපා සැකසූ පාඨවලට සවන් දෙමින්, ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 1.2 :** උපදෙස්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද :** 03 යි.

**ඉගෙනුම් පල :**

- උපදෙස් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- උපදෙස්වලට වාචික ප්‍රතිචාර දක්වයි.
- උපදෙස් අනුව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ පෙළ පොතේ පාඩමට සවන් දීමට සලස්වන්න.
- එම පාඩම කිහිප වරක් සවන්දීමට සලස්වන්න.
- **මූලික වදන්** කෙරෙහි අවධානය යොමු කරවන්න.
- උපදෙස් සහිත ප්‍රකාශන හඳුනා ගැනීමට සලස්වන්න.
- උපදෙස්වලට සවන් දී ප්‍රතිචාර දැක්වීමට අවස්ථා ලබා දෙන්න.
- පෙළ පොතේ පාඩමට අදළ අභ්‍යාස කරවන්න.
- **පුහුණුව** සඳහා ලබා දී ඇති භාෂා භාවිත හුරු කරවන්න.

**මූලික වදන් :**

- **පාසලට යන අතරතුර දී පිළිපැදිය යුතු උපදෙස්**

| | | |
|---|---|---|
| පුතා | කහ ඉරෙන් | නගින්න |
| දුව | දකුණු පැත්තෙන් | අල්ල ගන්න |
| අම්මා | ටිකට් එකක් | ගලවන්න. |
| ආච්චි | බස් එකක් | බහින්න. |
| මමේ | බෑග් එකක් | |
| | ඉස්සරහට යන්න. | |
| | පාර මාරු වෙන්න. | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

කහ ඉරෙන් පාර මාරු වෙන්න.
දකුණු පැත්තෙන් යන්න.
පරිස්සමින් යන්න.

ඉස්සරහින් බහින්න.
පිටි පස්සෙන් නගින්න.

ටිකට් එකක් ගන්න
බෑග් එක ගන්න.

මෙතනින් වාඩි වෙන්න.
ඉස්සරහින් වාඩි වෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- පෙළ පොතේ පාඩමට අදළ ව සකස් කර ගත් හඬ පටයක්
- පින්තූර කාඩ් පත්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- අලුත් වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- උපදෙස්වලට වාචික ප්‍රතිචාර දක්වයි.
- උපදෙස් පිළිපැදිය යුතු බව පිළිගනියි.
- දෙන ලද උපදෙස් අනුව කටයුතු කරයි.

## වචන මාලාව

කහ ඉරෙන් - மஞ்சல் கோடு
දකුණු පැත්තෙන් - வலப் பக்கமா
මාමේ ටිකට් එකක් - மாமா டிக்கட் ஒன்று
බස් එකක් - பஸ் ஒன்று
බෑග් එකක් - பேக் ஒன்று

පරිස්සමින් යන්න. - கவனமா போங்க
ඉස්සරහින් බහින්න. - முன்னால இறங்குங்க
පිටි පස්සෙන් නගින්න. - பின்னால ஏறுங்க
ඉස්සරහට යන්න. - முன்னுக்கு போங்க
මෙතනින් වාඩි වෙන්න. - இங்க உக்காருங்க
ඉස්සරහින් වාඩි වෙන්න. - முன்னால உக்காருங்க
ටිකට් එකක් ගන්න. - டிக்கட எடுங்க
බෑග් එක ගන්න. - பேக்க எடுங்க

**නිපුණතාව 01 :** එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් මැනවින් ගළපා සැකසූ පාඨවලට සවන් දෙමින් ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 1.3 :** යමක් පිළිබඳ විමසීම්වලට හා මග විමසුම්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද :** 04 යි.

**ඉගෙනුම් පල :**

- මග විමසීම් අවස්ථාව තේරුම් ගෙන ප්‍රකාශ කරයි.
- මග විමසීම්වල දී භාවිත වචන හඳුනා ගෙන කියයි.
- මග විමසීම්වල දී නිවැරදි ප්‍රතිචාර දක්වයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ පෙළ පොතේ පාඩම තෝරා ගන්න.
- අදාළ පාඩම හඬ පටයක් මගින් හෝ සුදුසු ක්‍රමයක් භාවිත කරමින් සවන් දීමට සලස්වන්න.
- එම පාඩම කිහිප වරක් සවන් දීමට සලස්වන්න.
- පාඩමේ ඇති මග විමසීම් (ශිෂ්‍යයින් යොදා ගෙන) ආදර්ශනය කරන්න.
- **මූලික** වදන්වලට අවධානය යොමු කරවන්න.
- **පුහුණුව සඳහා** ලබා දී ඇති භාෂා භාවිත හුරු කරවන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා එම භාෂා භාවිත යොදා ගන්න.
- පෙළ පොතේ අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික** වදන් :

- **විදුහල්පති තුමා හමුවීමට එන අයෙක් කාර්යාලය විමසන අවස්ථාවකට සවන්දීම**

| | |
|---|---|
| මම | ආවේ |
| මට | ඉන්නේ |
| විදුහල්පති තුමා | කොහේ ද |
| දුව | යන්නේ |
| පුතා | කාර්යාලය. |
| දුවට | හම්බවෙන්න . |
| පුතාට | ඕනෑ. |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

| | |
|---|---|
| විදුහල්පති තුමා ඉන්නේ කොහේ ද? | විදුහල්පති තුමා යන්නේ කොහේ ද? |
| ගුරුතුමා ඉන්නේ කොහේ ද? | ගුරුතුමා යන්නේ කොහේ ද? |
| අම්මා ඉන්නේ කොහේ ද ? | අම්මා යන්නේ කොහේ ද ? |
| තාත්තා ඉන්නේ කොහේ ද ? | තාත්තා යන්නේ කොහේ ද? |
| ආච්චි ඉන්නේ කොහේ ද ? | ආච්චි යන්නේ කොහේ ද? |
| රගු ඉන්නේ කොහේ ද ? | රගු යන්න් කොහේ ද? |
| ඔයා ඉන්නේ කොහේ ද ? | ඔයා යන්නේ කොහේ ද? |

(ප්‍රායෝගික ව පන්ති කාමරයේ යොදා ගන්න.)

**ගුණාත්මක යෙදවුම් :**

- පෙළ පොතේ පාඩමට අදළ ව සකස් කර ගත් හඬ පටයක්.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- මග විමසීම් අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- මග විමසීමට අදළ වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- මග විමසීම්වලට අදළ ප්‍රතිචාර දක්වයි.
- විමසීම් කිරීමට ඇති හැකියාව පිළිබඳ සතුට ප්‍රකාශ කරයි.

වචන මාලාව

| | | |
|---|---|---|
| මම | - | நான் |
| මට | - | எனக்கு |
| විදුහල්පති තුමා | - | அதிபர் அவர்கள் |
| දුව | - | மகள் |
| පුතා | - | மகன் |
| දුවට | - | மகளுக்கு |
| පුතාට | - | மகனுக்கு |
| යන්නේ | - | போறீங்க |
| ඉන්නේ | - | இருக்குறீங்க |
| ආවේ | - | வந்தீங்க |
| කොහේ ද? | - | எங்க |
| කාර්යාලය | - | காரியாலயம் |
| හම්බවෙන්න | - | சந்திக்க |
| ඕනෑ. | - | வேணும் |

**නිපුණතාව 1.0 :** එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් මැනවින් ගළපා සැකසූ පාඨවලට සවන් දෙමින් ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 1.4 :** නිවේදනවලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද :** 03 යි.

**ඉගෙනුම් පල :**

- සවන් දුන් නිවේදනයේ ඇතුළත් පණිවිඩය ප්‍රකාශ කරයි.
- නිවේදනයේ ඇතුළත් අලුත් වචන හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- නිවේදවලට අනුව කටයුතු කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ පාඩම තෝරන්න.
- පාඩමේ ඇතුළත් නිවේදනය සවන් දීමට සලස්වන්න.
- නිවේදනයෙන් කියවෙන අදහස ශිෂ්‍යයන්ගෙන් ඉස්මතු කරගන්න.
- මූලික වදන් කෙරේ හා පුහුණුව සඳහා ලබා දී ඇති කරුණු ශිෂ්‍යන්ගේ අවධානයට යොමු කරවන්න.
- නිවේදනයේ ඇතුළත් උපදෙස් හඳුනා ගැනීමට යොමු කරන්න.
- පාඩමට අදළ අභ්‍යාස කරවන්න.

**මූලික වදන් :**

- **නැටුම් හා සංගීත පන්තිවලට සහභාගී වන ශිෂ්‍යයන්ට කෙරෙන නිවේදනයක්**

කරුණාවෙන්
පිළිගැනීමේ

සහභාගි වන

නැටුම් කාමරයට

ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට

පැවැත්වෙන

උත්සවය

- **පුහුණුව සඳහා යොදාගන්න.**

| | | | |
|---|---|---|---|
| අද. | දවල් | අද හවස පැමිණෙන්න. | කරුණාවෙන් සවන්දෙන්න. |
| හෙට. | හවස | හෙට උදේ පැමිණෙන්න. | |
| අනිද්දා | රාත්‍රි | අනිද්දා දවල් පැමිණෙන්න. | |

**ගුණාත්මක යෙදවුම් :**

- සරල නිවේදනයක්
- පාසලේ උදය රැස්වීමේ කරන නිවේදනයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- නිවේදනය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නිවේදනයෙන් කියවෙන තොරතුරු පැහැදිලි කරයි.
- නිවේදනවලට අවධානයෙන් සවන් දිය යුතු බව පිළිගනියි.
- නිවේදන තේරුම් ගෙන ඒ අනුව කටයුතු කරයි.

වචන මාලාව

| | | |
|---|---|---|
| අද. | - | இன்றக்கி |
| හෙට. | - | நாளக்கி |
| අනිද්දා | - | நாளமறுதினம் |
| දවල් | - | மதியம் |
| හවස | - | பின்னேரம் |
| රාත්‍රි | - | இரவு |
| පිළිගැනීමේ | - | வரவேற்கும் |
| උත්සවය | - | விழா |
| පැවැත්වෙන | - | நடைபெறும் |
| සහභාගි වන | - | பங்குபற்றும் |
| ශිෂ්‍ය ශිෂ්‍යාවන් | - | மாணவ,மாணவிகள் |
| අද හවස පැමිණෙන්න | - | இன்றக்கி பின்னேரம் வாங்க |
| හෙට උදේ පැමිණෙන්න | - | நாளக்கி காலயில வாங்க |

**නිපුණතාව 1.0 :** එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් මැනවින් ගළපා සැකසූ පාඨවලට සවන් දෙමින් ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 1.5 :** ගුවන් විදුලි ප්‍රචාර හා පටිගත කිරීම්වලට සවන් දෙයි. රස විඳියි.

**කාලච්ඡේද :** 04 යි.

**ඉගෙනුම් පල :**

- ගීතයෙන් කියවෙන සිද්ධිය පැහැදිලි කරයි.
- ගීතයට සවන් දෙමින් ගායනා කරයි.
- ගීතය ගායනා කරමින් රස විඳියි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ගීතය කිහිප වාරයක් සවන් දීමට සලස්වන්න.
- ගීතයට සවන් දෙමින් තාල තබන්න.
- ගීතයට තාල තැබීම සඳහා ශිෂ්‍යයන් ද සම්බන්ධ කරවන්න.
- ගීතය සාමූහික ව ගායනා කරන්න.
- ගීතයේ අර්ථය පැහැදිලි කරමින් රස විඳීමට පොලඹවන්න.
- පාඩමේ ඇතුළත් ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **තාරකා පද්‍ය පන්තිය**

දිලිහි දිලිහි
ආකාසේ
බබළන මල්
තාරකා
බැබළි බැබළි
දිලිහෙන මල්

ගන්ටත් බෑ
දෙන්ටත් බෑ
පුංචි රුවන්
තාරකා
කළුවර රෑ
හිනහ වෙවී

**පුහුණුව සඳහා යොදා ගන්න.**

**තාරකා පද්‍ය පන්තිය**

දිලිහි දිලිහි
ආකාසේ
බබළන මල්
තාරකා

කළුවර රෑ
ආකාසේ
හිනහ වේවි
තාරකා

බැබළි බැබළි
අකාසේ
දිලිහෙන මල්
තාරකා

ගන්ටත් බෑ
දෙන්ටත් බෑ
පුංචි රුවන්
තාරකා

**ගුණාත්මක යෙදවුම්:**

- නන්දා මාලනී ගායනා කරන එම ගීතය ඇතුළත් CD පටය/කැසට් පටය

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- ගීතයට සවන් දෙමින් තාල තබයි.
- ගීතයේ සඳහන් අවස්ථා හඳුනා ගෙන කියයි.
- සාමූහික ව/තනි තනි ව ගීතය ගායනා කරයි.
- ගීත ඇසීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

**වචන මාලාව**

| | | |
|---|---|---|
| දිලිහි දිලිහි | - | **மின்னி மின்னி** |
| ආකාසේ | - | **வானத்தில்** |
| බබළන මල් | - | **ஒளிரும் பூ** |
| තාරකා | - | **தாரகை** |
| ගන්ටත් බෑ | - | **எடுக்கவும் முடியாது** |
| දෙන්ටත් බෑ | - | **கொடுக்கவும் முடியாது** |
| පුංචි රුවන් | - | **சின்ன மாணிக்கம்** |
| තාරකා | - | **தாரகை** |

## කථනය

**නිපුණතාව 2.0 :** පොදු සිදු විය හැකි හා කාල්පනික , විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.1 :** උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද :** 04 යි.

**ඉගෙනුම් පල :**

- උපදෙස් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- උපදෙස්වලට වාචික ප්‍රතිචාර දක්වයි
- උපදෙස්වලට අනුව ක්‍රියා කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පෙළ පොතේ පාඩම සවන් දීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පාඩම කිහිප වාරයක් ඇසීමට සලස්වන්න.
- උපදෙස් සහිත වාක්‍ය ඉස්මතු කරවන්න.
- පාඩමේ ඇති උපදෙස් තේරුම් ගැනීමට අවස්ථාව සලසන්න.
- ශිෂ්‍යයන් භූමිකා රංගනයක යොදවමින් උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව සලස්වන්න.
- **මූලික** වදන් හා භාෂා භාවිතයන් කෙරෙහි අවධානය යොමු කරවන්න.
- පුහුණුව සඳහා ලබා දී ඇති වාක්‍ය භාවිත කරමින් උපදෙස් හඳුනා ගැනීමට හුරු කරවන්න.
- පාඩමට අදාළ අභ්‍යාසවල නිරත කරවන්න.

**මූලික වදන් :**

- **ගොයම් කපන අවස්ථාවක්**

| | | |
|---|---|---|
| නැන්ද | කුඹුර | එන්න. |
| මාමා | ගොයම් | කන්න. |
| පුංචි අම්මා | නියර | එකතු කරන්න. |
| බාප්පා | මඩ | ගෙනියන්න. |
| අපි | වතුර (තේ වතුර) | අඬ ගහන්න. |
| | කරල් (වී) | ගන්න එපා. |
| | දෑ කැති | බහින්න එපා. |
| | | නියරේ ඉන්න. |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

| | | |
|---|---|---|
| මාමට අඬ ගහන්න. | කුඹුරට යන්න. | කුඹුරට යන්න එපා. |
| නැන්දට අඬ ගහන්න. | නියරට යන්න. | නියරට යන්න එපා. |
| බාප්පට අඬ ගහන්න. | ගෙදරට යන්න. | ගෙදරට යන්න එපා. |

| | |
|---|---|
| දවල්ට එකතු කරන්න. | වතුරට බහින්න එපා. |
| හවසට එකතු කරන්න. | මඩට බහින්න එපා. |
| උදේට එකතු කරන්න. | කුඹුරට බහින්න එපා. |

**ගුණාත්මක යෙදවුම් :**

- උපදෙස් ලියූ පත්‍රිකා කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- උපදෙස් සහිත වාක්‍ය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- උපදෙස් තේරුම් ගෙන ඒ අනුව කටයුතු කරයි.
- උපදෙස්වලට වාචික ප්‍රතිචාර දක්වයි.
- උපදෙස් පිළිපැදිය යුතු බව පිළිගනියි.

වචන මාලාව

| | | |
|---|---|---|
| නැන්ද | - | மாமி |
| මාමා | - | மாமா |
| අපි | - | நாம |
| කුඹුර | - | வயல் |
| ගොයම් | - | நெல் |
| නියර | - | வரம்பு |
| මඩ | - | சேறு |
| වතුර | - | தண்ணீ |
| තේ වතුර | - | தேதண்ணீ |
| කරල් (වී) | - | கதிர் |
| දෑ කැති | - | அரிவால் |

එකතු කරන්න - ஒன்று சேருங்க

අඬ ගහන්න - கூப்பிடுங்க

නියරේ ඉන්න - வரம்பில இருங்க

ගන්න එපා - எடுக்க வேணாம்

බහින්න එපා - இறங்க வேணாம்

**නිපුණතාව 2.0 :** පොදු සිදු විය හැකි සහ කාල්පනික, විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** 2.2 : මග විමසීම්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- මග විමසීම් අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- මග විමසීම්වල දී භාවිත වචන හඳුනා ගෙන කියයි.
- මග විමසීම්වලට නිවැරදි ප්‍රතිචාර දක්වයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස්:**

- පෙළ පොතේ පාඩම තෝරා ගන්න.
- පාඩම කිහිප වාරයක් සවන් දීමට සලස්වන්න.
- මග විමසීම් අවස්ථා හඳුනා ගැනීමට අවස්ථාව සලසා දෙන්න.
- මූලික වදන් හා භාෂා භාවිතයන් හුරු කරවන්න.
- පුහුණුව සඳහා ලබා දී ඇති ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් යොමු කරවන්න.
- පාඩමට අදාළ අභ්‍යාසවල නිරත කරවන්න.

මූලික වදන් :

- **විදුහල්පති තුමා හමුවීමට එන කෙනෙකුට කාර්යාලයට යාමට උදවු කිරීම.**

| | | | |
|---|---|---|---|
| විදුහල්පති තුමා | කවු ද? | ටිකක් ඉන්න/ටිකක් වෙලා ඉන්න. | |
| ගුරුතුමිය | මොකද් ද? | දෙන්න | දකුණට |
| ආරාධනා පත්‍රයක් | පුළුවන්ද? | මෙතනින් | වමට |
| | බෑ | අඹ ගහ ළඟින් | යනකොට |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

| | |
|---|---|
| මල්ලි ටිකක් ඉන්න | විදුහල්පති තුමා හමුවන්න පුළුවන් ද? |
| නංගි ටිකක් ඉන්න | ගුරුතුමා හමුවන්න පුළුවන් ද? |
| කමල් ටිකක් ඉන්න | ගුරුතුමිය හමුවන්න පුළුවන් ද? |
| ඔයා ටිකක් ඉන්න | |
| | ලියුමක් දෙන්න. |
| | ආරාධනා පත්‍රයක් දෙන්න. |

**ගුණාත්මක යෙදවුම් ඃ**

- සකසා ගත් දෙබස් කිහිපයක්.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- මග විමසීම හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- මග විමසීම්වල දී භාවිත වචන හඳුනා ගෙන කියයි.
- මග විමසීම්වලට ප්‍රතිචාර දක්වයි.
- මග විමසීම් කිරීමට ඇති හැකියාව පිළිබඳ සතුට ප්‍රකාශ කරයි.

වචන මාලාව

| | |
|---|---|
| විදුහල්පති තුමා | - அதிபர் அவர்கள் |
| ගුරුතුමිය | - ஆசிரியை அவர்கள் |
| ආරාධනා පත්‍රයක් | - அழைப்பிதல் |
| කවු ද? | - யார்? |
| මොකද්ද? | - என்ன? |
| බෑ | - முடியாது. |

**නිපුණතාව 2.0 :** පොදු සිදු විය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** 2.3 : සුහද සංවාදවල දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- සුහද සංවාදවල දී භාවිත වන වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සුහද සංවාදවල දී ප්‍රශ්න අසයි.
- සංවාදවලට සහභාගි වෙමින් ප්‍රතිචාර දක්වයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සුදුසු ක්‍රමයක් යොදා ගෙන පාඩමේ ඇති දෙබස ඇසීමට සලස්වන්න.
- කිහිප වරක් දෙබස් සහිත සංවාදය ඇසීමට සලස්වන්න.
- වෙසක් කූඩුවක් සකස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පාඩමෙහි යොදා ගෙන ඇති සංවාදවල දී භාවිත වචන කෙරෙහි අවධානය යොමු කරවන්න.
- **මූලික** වදන් මාලාව හා **පුහුණුව** සඳහා දී ඇති භාෂා භාවිතයන් ශිෂ්‍යයන්ට හුරු කරවන්න.
- පුහුණුව සඳහා යොදා ඇති වාක්‍ය විවිධ අවස්ථා සඳහා යොදා ගන්න.
- පාඩමට අදාළ අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික** වදන් :

- **යහළුවන් දෙදෙනෙකු අතර කතා බහක් (වෙසක් කූඩුවක් සෑදීම)**

| | | |
|---|---|---|
| වෙසක් කූඩුව | කාට ද? | තියෙනවා. |
| උණ බට | මොකක් ද? | කපනවා. |
| පාප්ප | කවදා ද? | ගේන්න. |
| සව් කඩදාසි | | |
| නූල් | | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

| | | |
|---|---|---|
| කූඩුව ඕනෑ. | නූල් ගෙන්න. | ගෙදර තියෙනවා. |
| උණ බට ඕනෑ. | උණ බට ගේන්න. | කඩේ තියෙනවා. |
| පාප්ප ඕනෑ. | පාප්ප ගේන්න. | පන්තියේ තියෙනවා. |
| නූල් ඕනෑ. | කොළ ගේන්න. | කොළ කපනවා. |
| එන්නේ කවදා ද? | කාට ද? | උණ බට කපනවා. |
| යන්නේ කවදා ද? | මොකද් ද? | නූල් කපනවා. |
| උත්සවය කවදා ද? | | රෙදි කපනවා. |

**ගුණාත්මක යෙදවුම් :**

- සකස් කර ගත් දෙබස් ඇතුළත් පත්‍රිකා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- සංවාදයේ ඇතුළත් අවස්ථාව හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සංවාදවල දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ප්‍රශ්න අසමින් පිළිතුරු ලබා දෙයි.
- සංවාදවලට සහභාගි වී අදහස් ප්‍රකාශ කරයි.
- සංවාදවලට සහභාගි වීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

**වචන මාලාව**

| | | |
|---|---|---|
| වෙසක් කූඩුව | - | வெசாக்கூடு |
| උණ බට | - | மூங்கில் |
| පාප්ප | - | பசை |
| සව් කඩදාසි | - | டிசூதாள் |
| නූල් | - | நூல் |
| කාට ද? | - | யாருக்கு ? |
| මොක ද? | - | என்ன ? |
| කවදා ද? | - | என்றக்கி ? |
| තියෙනවා | - | இருக்கு |
| කපනවා | - | வெட்டுறன் |
| ගේන්න | - | கொண்டு வாங்க |

**නිපුණතාව 2.0 :** පොදු සිදුවිය හැකි සහ කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.4:** තොරතුරු හුවමාරු කර ගැනීමේ දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද :** 04 යි.

**ඉගෙනුම් පල :**

- සිද්ධියට අදාළ තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- තොරතුරු දැන ගැනීම සඳහා මැදිහත් ව කටයුතු කරයි.
- තොරතුරු හුවමාරු කර ගනිමින් අදහස් ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ පාඩම තෝරා ගන්න.
- උචිත ක්‍රමයක් භාවිත කරමින් පාඩමට ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- පාඩමේ ඇතුළත් තොරතුරු හඳුනා ගැනීමට අවස්ථාව සලසා දෙන්න.
- නිවසේ දී සිදු වන එවැනි අවස්ථා ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- ශිෂ්‍යයින් කිහිපදෙනකු යොදා ගෙන එවැනි අවස්ථාවක් ඉදිරිපත් කරවන්න.
- **මූලික වදන්හි** ඇති පද රටා කෙරෙහි අවධානය යොමු කරවන්න.
- පුහුණුව සඳහා දී ඇති ක්‍රියාකාරකම්හි නිරත කරවන්න.
- පෙළ පොතේ අදාළ පාඩමෙහි ක්‍රියාකාරකම් කරවන්න.

**මූලික වදන් :**

- **අලුත් නිවසකට යාම**

  මාමා

  නැන්දා

  නිවසකට

  උත්සවයක්

  තෑග්ගක්

  ඔරලෝසුවක්

  පිත්තල පහනක්

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

| | |
|---|---|
| අලුත් නිවස | නිවස ලස්සන යි . |
| අලුත් ඇඳුම් | පහන ලස්සන යි. |
| අලුත් පහන | තෑග්ග ලස්සන යි. |

| | |
|---|---|
| මල්ලි ලෑස්ති වෙන්න. | මාමට සන්තෝස යි . |
| නංගි ලෑස්ති වෙන්න. | නැන්දට සන්තෝස යි. |
| නැන්දා ලෑස්ති වෙන්න. | |
| මාමා ලෑස්ති වෙන්න. | මාමලට සන්තෝස යි. |
| බාප්පා ලෑස්ති වෙන්න. | නැන්දලට සන්තෝස යි. |
| පුංචි ලෑස්ති වෙන්න. | |
| | අපට සන්තෝස යි . |
| | එයාලට සන්න්තෝස යි. |

**ගුණාත්මක යෙදවුම් :**

- පාඩමට අදාළ ව සකස් කර ගත් පින්තූර කිහිපයක්.
- දෙබස් ඇතුළත් පත්‍රිකා.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- තොරතුර ඇතුළත් සිද්ධිය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- තොරතුරු හුවමාරු කර ගැනීමට මැදිහත් වෙයි.
- තම අදහස් ඉදිරිපත් කරමින් තොරතුරු හුවමාරු කරයි.
- තොරතුරු ප්‍රකාශ කිරීමේ හැකියාව පිළිබඳ සතුට ප්‍රකාශ කරයි.

වචන මාලාව

| | | |
|---|---|---|
| නිවසකට | - | **வீடொன்றுக்கு** |
| උත්සවයක් | - | **விழாவொன்று** |
| තෑග්ගක් | - | **பரிசொன்று** |
| ඔරලෝසුවක් | - | **மணிக்கூடொன்று** |
| පිත්තල පහනක් | - | **பித்தள விளக்கொன்று** |

**නිපුණතාව** 2.0 : පොදු සිදු විය හැකි හා කාල්පනික, විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** 2.5: ගනුදෙනුවල දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- ගනුදෙනු අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ගනුදෙනු අවස්ථාවල භාවිත වචන හඳුනා ගෙන කියයි.
- සරල ගනුදෙනුවලට සහභාගි වෙමින්, මැදිහත් වී කටයුතු කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පෙළ පොතේ පාඩම සවන් දීමට සලස්වන්න.
- එම අවස්ථාව හඳුනා ගැනීමට සලස්වන්න.
- එම අවස්ථාව නිරූපණය කිරීමට ශිෂ්‍යයින් යොමු කරන්න.
- පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- පද රටා හා වාක්‍ය රටා ප්‍රගුණ කරවීමට ක්‍රියාකාරකම් සකස් කරන්න.
- අදාළ ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.
- පෙළ පොතෙහි අභ්‍යාස කරවන්න.

**මූලික වදන් :**

- **උත්සවයක සංග්‍රහ අවස්ථාවක්**

| | |
|---|---|
| මේසය | ඔයා |
| කැවුම් | මෙයා |
| පිගාන | අරයා |
| කෙසෙල් ගෙඩි | |
| දොදොල් | අතන |
| කොකිස් | මෙතන |
| අලුවා | |
| පලතුරු බීම | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

නංගි කැවුම් ගේන්න
මල්ලි කැවුම් ගේන්න
ඔයා කැවුම් ගේන්න

නැන්දා තේ හදනවා
අක්කා තේ හදනවා
නිලූකා තේ හදනවා

මෙතන තේ හදන්න
අතන තේ හදන්න

**ගුණාත්මක යෙදවුම් :**

- පාඩමට අදාළ පින්තූර කිහිපයක්
- දෙබස් ලියන ලද පත්‍රිකා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- පාඩමේ සඳහන් ගනුදෙනු අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සරල ගනුදෙනුවල දී භාවිත වචන හඳුනා ගෙන කියයි.
- ගනුදෙනුවලට මැදිහත් වී කටයුතු කරයි.
- ගනුදෙනුවලට සහභාගී වී තම අදහස් ප්‍රකාශ කරයි.

වචන මාලාව

මේසය - மேசை
කැවුම් - பலகாரம்
පිගාන - பீங்கான்
කෙසෙල් ගෙඩි - வாழைப்பழம்

දොදොල් - தொதொல்
කොකිස් - கொகீஸ்
අලුවා - அலுவா
පලතුරු බීම - பழரசம்

ඔයා - நீங்க
මෙයා - இவங்க
අරයා - அவங்க

**නිපුණතාව** 2.0 : පොදු සිදු විය හැකි හා කාල්පනික,විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** 2.6 : කෙටි සරල වාචික ප්‍රකාශන ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- තමා කැමති විනෝදාංශය නම් කරයි.
- මාතෘකාවට අදාළ ව කරුණු පෙළ ගස්වා කියයි.
- කෙටි වාචික ඉදිරිපත් කිරීමක් කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ පාඩම තෝරා ගන්න.
- පෙළ පොතේ ඇතුළත් පාඩම කියවීමට අවස්ථාව සලසන්න.
- ගුරුවරයා විසින් ආදර්ශනය කර පෙන්වන්න.
- ශිෂ්‍යයන් ලවා එම දෙබස් කියවීමට හුරු කරන්න.
- දෙබස්වලින් කියවෙන අදහස් පැහැදිලි කරන්න.
- **මූලික වදන්** හා පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් හුරු කරවන්න.
- ශිෂ්‍යයන්ගේ විනෝදාංශ විමසන්න. ඒවා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- පෙළ පොතෙහි ඇති අභ්‍යාස හා ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

**මූලික වදන් :**

- **මම කැමැති විනෝදාංශය**

රූපවාහිනී නැරඹීම

| | |
|---|---|
| ළමා වැඩ සටහන් | මං ආස යි |
| කතන්දර | මං කැමැති යි |
| | |
| සත්තු | එකතු කරන්න |
| මුහුදු පැළෑටි | කියවන්න |
| දිය ඇලි | බලන්න |
| ගස් වැල් | කියන්න |
| වනාන්තර | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

මං ආස යි.
මම කැමති යි.

| | | |
|---|---|---|
| මං ආස යි.<br>මං කැමති යි. | රූපවාහිනී<br>සත්තු<br>වනාන්තර<br>ළමා වැඩසටහන් | බලන්න. |

මං ආස යි රූපවාහිනී බලන්න.
මං ආස යි සින්දු කියන්න.
මං කැමතියි පොත් කියවන්න.
මං කැමති යි මුද්දර එකතු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ළමා විනෝදාංශ පිළිබඳ මාතෘකා කිහිපයක්
- දෙබස් ලියූ පත්‍රිකා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- තම විනෝදාංශ නම් කරයි.
- සිත්ගත් විනෝදාංශයක් පිළිබඳ කරුණු පෙළ ගස්වයි.
- භාෂා භාවිතයන් යොදා ගනිමින් ඉදිරිපත් කිරීම් කරයි.
- තම විනෝදාංශ පැහැදිලි කිරීමට ඇති හැකියාව පිළිබඳ සතුට ප්‍රකාශ කරයි.

**වචන මාලාව**

| | | |
|---|---|---|
| වැඩ සටහන් | - | நிகழ்ச்சி |
| කතන්දරය | - | கதை |
| එකතු කරන්න | - | ஒன்று சேருங்க |
| මුහුදු පැළෑටි | - | கடல் தாவரம் |
| දිය ඇලි | - | நீர் வீழ்ச்சிகள் |
| ගස් වැල් | - | விழுதுகள் |
| වනාන්තර | - | காடு |
| මං ආස යි | - | எனக்கு ஆசை |
| මං කැමති යි | - | எனக்கு விருப்பம் |

**නිපුණතාව** 3.0 : එදිනෙදා පොදු මෙන් ම සිදු විය හැකි හා වෙනත් අවස්ථා ගැන ද සමීප හා නුහුරු කතා බස්වලින් සැකසුණු විවිධ පාඨ (Texts) අවබෝධයෙන් කියවා ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 3.1 :** ලිපි හා වෙනත් ලේඛන කියවයි.නරඹයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- ලිපි කියවා සරල අදහස් කියයි.
- ලිපියේ ඇතුළත් තොරතුරු කියවා ප්‍රකාශ කරයි.
- සරල ලිපියක් කියවයි.
- වෙනත් ලේඛන කියවයි.

**පාඩම සැලසුම කිරීම සඳහා උපදෙස් :**

- තමා විසින් සකස් කර ගත් ලිපි කිහිපයක් ප්‍රදර්ශනය කරන්න.
- පාඩමේ ඇතුළත් ලිපිය කියවා ආදර්ශනය කරන්න.
- පෙළ කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- **මූලික වදන්වල ඇති** වචන කෙරෙහි අවධානය යොමු කරවන්න.
- එහි ඇතුළත් තොරතුරු සාකච්ඡා කරන්න.
- පාඩමේ ඇතුළත් ලිපිය තනි ව කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලසා දෙන්න. (කේවල ව)
- **පුහුණුව** සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි අවධානය යොමු කරවන්න.
- එම රටා හුරු කරවන්න.
- පාඩමට අදාළ අභ්‍යාසවල නිරත කරවන්න.

**මූලික වදන් :**

- **ආච්චීගෙන් ලියුමක්**

  දෙවි පිහිට යි

  නිවාඩුව

  ආදරණීය

  නිරෝගි

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

| | |
|---|---|
| අද නිවාඩු යි | පීනන්න පුළුවන් |
| හෙට නිවාඩු යි | නාන්න පුළුවන් |
| අනිද්දා නිවාඩු යි | සෙල්ලම් කරන්න පුළුවන් |
| අද නිවාඩු ද? | පුතාගේ සැප සනීප කොහොම ද? |
| හෙට නිවාඩු ද? | දුවගේ සැප සනීප කොහොම ද? |
| අනිද්දා නිවාඩු? | ආච්චිගේ සැප සනීප කොහොම ද? |
| | සීයාගේ සැප සනීප කොහොම ද? |

**ගුණාත්මක යෙදවුම් :**

- පෞද්ගලික ලිපියක්.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- ලිපියේ ඇතුළත් තොරතුරු  හඳුනා ගෙන කියයි.
- ලිපිය කියවයි.
- පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කියවයි.
- ලිපි කියවීමට ඇති හැකියාව පිළිබඳ සතුට ප්‍රකාශ කරයි

වචන මාලාව

| | | |
|---|---|---|
| දෙවි පිහිටයි | - | **கடவுள் துணை** |
| නිවාඩුව | - | **விடுமுறை** |
| ආදරණීය | - | **அன்புள்ள** |
| නිරෝගි | - | **சுகதேகி/நோயற்றவன்** |

**නිපුණතාව** 3.0 : එදිනෙදා පොදු, මෙන් ම සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන i óm yd k gyqe l ; dhi ja, ks a i el i k( qúúO mdG ^Text) අවබෝධයෙන් කියවා, ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම 3.2 :** සාහිත්‍යයික පාඨ කියවයි නරඹයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- පද්‍ය ගායනා කිරීමේ හුරුව ලබයි.
- පද්‍ය ගායනා කරයි.
- පද්‍ය ගායනා කරමින් රස විඳියි.

**පාඩම සැලසුම කිරීම සඳහා උපදෙස් :**

- සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් පද්‍ය පන්තිය සවන් දීමට යොමු කරන්න
- පද්‍ය පන්තියේ අර්ථය ශිෂ්‍යයන්ට පැහැදිලි කරන්න.
- පෙළ පොතේ ඇති පද්‍ය පන්තිය ශිෂ්‍යයන් සමග ගායනා කරන්න.
- කණ්ඩායම් ගායනයට අවස්ථාව දෙන්න.
- පද්‍ය පන්තිය කණ්ඩායම් වශයෙන්/ කේවල ව ගායනය කරමින් රස විඳීමට යොමු කරන්න.
- අභ්‍යාස හා ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **තාරකා පද්‍ය පන්තිය**

දිලිහි දිලිහි
බැබළි බැබළි
ආකාසේ
තාරකා
ගන්ටත් බෑ.
දෙන්ටත් බෑ.

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

**තාරකා**

දිලිහි දිලිහි
ආකාසේ
බබළන මල්
තාරකා

ගන්ටත් බෑ.
දෙන්ටත් බෑ.
පුංචි රුවන්
තාරකා

බැබළි බැබළි
අකාසේ
දිලිහෙන මල්
තාරකා

කළුවර රෑ
ආකාසේ
හිනහ වේවී.
තාරකා

**ගුණාත්මක යෙදවුම් :**

- පද්‍ය ඇතුළත් හඬ පටයක්
- පද්‍ය පන්තියේ අන්තර්ගතයට ගැළපෙන පින්තූර කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- පද්‍ය පන්තිය ගායනයට ඉදිරිපත් වෙයි.
- පද්‍ය පන්තිය අසමින් තාල තබයි.
- පද්‍ය පන්තිය ගායනා කරයි.
- ගායනා කරමින් රස විඳියි.

**වචන මාලාව**

| | | |
|---|---|---|
| දිලිහි දිලිහි | - | மின்னி மின்னி |
| බැබළි බැබළි | - | ஒளிர்ந்து ஒளிர்ந்து |
| ආකාසේ | - | வானத்தில |
| තාරකා | - | தாரகை / நட்சத்திரம் |
| ගන්ටත් බෑ | - | எடுக்கவும் முடியாது |
| දෙන්ටත් බෑ | - | கொடுக்கவும் முடியாது |

**නිපුණතාව** 3.0 : එදිනෙදා පොදු සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා k yqqel ; dhi ja, ks ä el i bK( qúúO mdG ^Texts) අවබෝධයෙන් කියවා ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම** 3.3 : උපදෙස් කියවයි. නරඹයි.

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල** :

- උපදෙස් සහිත වැකි හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- උපදෙස් සහිත වැකි කියවයි.
- උපදෙස් කියවා ඒ අනුව කටයුතු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- පෙළ පොතේ ඇතුළත් පාඩම කියවා ආදර්ශනය කරන්න .
- එහි ඇතුළත් උපදෙස් හඳුනා ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබාදෙන්න.
- පාඩමේ ඇතුළත් උපදෙස් පිළිබඳ සාකච්ඡා කරන්න.
- පාඩම කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පුහුණුව සඳහා ලබා දී ඇති උපදෙස් සහිත වාක්‍ය කියවීමට හුරු කරන්න
- අදාළ අභ්‍යාස හා ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න

**මූලික වදන් :**

- **ගොයම් කපන අවසථාවක්.**

  නියර

  දෑ කැත්ත

  කමත

  කැවිලි

  වතුර

  තේ වතුර

  අල්ලන්න

  බෙදන්න

  මිටි බඳින්න.

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

තේ අල්ලන්න.
වතුර අල්ලන්න.
කෑම අල්ලන්න.
කෙසෙල් අල්ලන්න.

ගොයම් මිටි බඳින්න.
දර මිටි බඳින්න.

ගොයම් ගොඩ ගහන්න.
වී ගොඩ ගහන්න.

ගොයම් එකතු කරන්න.
වී එකතු කරන්න.
දර එකතු කරන්න.

වතුර ගෙන යන්න.
තේ ගෙන යන්න.
ගොයම් ගෙන යන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- උපදෙස් සහිත වැකි කිහිපයක්
- උපදෙස් සහිත පින්තූර කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- උපදෙස් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- උපදෙස් සහිත වැකි කියවයි.
- උපදෙස්වලට අනුව කටයුතු කරයි.
- උපදෙස් පිළිපැදිය යුතු බව පිළිගනියි.

**වචන මාලාව**

| | | |
|---|---|---|
| නියර | - | வரம்பு |
| දෑ කැත්ත | - | அரிவால் |
| කමත | - | பொலி / போரடிக்கும் இடம் |
| කැවිලි | - | இனிப்புகள் |
| අල්ලන්න | - | பிடிங்க |
| බෙදන්න | - | பிரிங்க |
| මිටි බඳින්න. | - | கட்டுங்க |

**නිපුණතාව 3.0 :** එදිනෙදා පොදු සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා නුහුරු කතාබස්වලින් සැකසුණු විවිධ පාඨ (Texts) අවබෝධයෙන් කියවා ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 3.4 :** ශ්‍රව්‍ය දෘශ්‍ය පාඨ හා වෙනත් මාධ්‍ය තොරතුරු කියවයි. නරඹයි.

**කාලච්ඡේද :** 03 යි.

**ඉගෙනුම් පල :**

- මග තොටේ දක්නට ලැබෙන දැන්වීම් කියවයි.
- පින්තූර සහිත දැන්වීම් කියවයි.
- දැන්වීම් කියවා අදාළ ප්‍රතිචාර දක්වයි.

**පාඩම සැලසුම කිරීම සඳහා උපදෙස් :**

- අදාළ පාඩම තෝරා ගන්න.
- ශිෂ්‍යයන් දැක ඇති දැන්වීම් විමසන්න.
- උපදෙස් සහිත වැකි කියවා ශිෂ්‍යයන්ට හඳුනා ගැනීමට අවසරාව සලසන්න.
- පාසලට එන අතරතුරේ දී දුටු උපදෙස් සහිත වැකි පිළිබඳ විමසන්න.
- නියමිත කොටස් කියවීමෙන් ආදර්ශනය කරන්න.
- පින්තූරවල උපදෙස් සහිත වැකි කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථා ලබා දෙන්න.
- **මූලික වදන්** හා **පුහුණුව** සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කියවීමට ඉඩ සලසන්න.
- අභ්‍යාස හා ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **විවිධ පාඨ සහිත දැන්වීම් කියවීම.**

  මෙහි

  කුණු

  දකුණු පැත්තෙන්

  කහ ඉරෙන්

  නිශ්ශබ්ද වන්න.

  ජලය බීමට පමණයි.

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

පාරේ කුණු දමන්න එපා.
මෙහි කුණු දමන්න එපා.
බස් රියේ කුණු දමන්න එපා.

ආහාර ගැනීමෙන් වළකින්න.
දුම්බීමෙන් වළකින්න.

දකුණු පැත්තෙන් යන්න.
කහ ඉරෙන් මාරු වන්න.

බීමට පමණි.
**අත් සේදීමට පමණි.**

**ගුණාත්මක යෙදවුම් :**

- සරල දැන්වීම් කිහිපයක්
- පින්තූර සහිත දැන්වීම් කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- සරල දැන්වීම් කියවීමට ඉදිරිපත් වෙයි.
- පින්තූර සහිත දැන්වීම් කියවා එහි අදහස කියයි.
- දැන්වීම් කියවයි.
- දැන්වීම් කියවා ඒ අනුව කටයුතු කළයුතු බව පිළිගනියි.

**වචන මාලාව**

මෙහි - இங்க
කුණු - குப்ப அழுக்கு

පැත්තෙන් - பக்கமா
කහ ඉරෙන් - மஞ்சல் கோட்ல

නිශ්ශබ්ද වන්න - அமைதியா இருங்க
ජලය බීමට පමණයි - தண்ணீ குடிக்க மட்டும்

# ලිවීම

**නිපුණතාව** 4.0 : පොදු සිදු විය හැකි සහ කාල්පනික අවස්ථා ගැන විවිධ භාෂා රටාවලින් යුක්ත කෙටි සරල වාක්‍ය ලියයි

**නිපුණතා මට්ටම** 4.1 : විස්තර පාඨ ලියයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- පාසල් පරිසරයේ භාවිත වචන හඳුනා ගෙන ලියයි.
- සරල වාක්‍ය ගොඩනගා ඉදිරිපත් කරයි.
- පාසල් පරිසරය ඇසුරින් සරල වාක්‍ය ලියයි.

**පාඩම සැලසුම කිරීම සඳහා උපදෙස්** :

- පාසල් පරිසරය ආශ්‍රිත ව යෙදෙන වචන පිළිබඳ ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- එම වචන ආශ්‍රයෙන් සාකච්ඡාවක නිරත වන්න.
- එම වචන පෙළ ගස්වමින් සරල වාක්‍ය ගොඩ නගන්න.
- වචන හඳුන්වා දී වාක්‍ය ලිවීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් හුරු කරවන්න.
- අභ්‍යාස හා ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන්** :

- **පාසල් පරිසරය ඇසුරින් සරල වාක්‍ය ලිවීම**.

| | |
|---|---|
| මම | ලියනවා |
| ඔයා | දුවනවා |
| අපි | නගිනවා |
| ගුරු තුමිය | කැඩෙනවා |
| පන්තිය | |
| පාසල | |
| පිට්ටනිය | |

- **පුහුණුව සඳහා යොදාගන්න**

මම යනවා.
අපි යනවා.
ගුරුතුමිය යනවා.
විමල් යනවා.

පිට්ටනියට දුවනවා.
පන්තියට දුවනවා.

අමල් පිට්ටනියට යනවා.
ගුරුතුමා පාසලට යනවා.
ගුරුතුමිය කැන්ටිමට යනවා.

**ගුණාත්මක යෙදවුම් :**

- පාසල් පරිසරය ආශ්‍රිත ලියන ලද වචන ලැයිස්තුවක් හා වාක්‍ය කිහිපයක්.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- පාසල් පරිසරය ආශ්‍රිත වචන හඳුනා ගෙන ලියයි.
- පුහුණුව සඳහා දී ඇති වාක්‍ය ලියයි.
- පාසල් පරිසරය ආශ්‍රිත ව භාවිත වාක්‍ය ලියයි.
- වාක්‍ය ලිවීමට ඇති හැකියාව පිළිබඳ සතුට ප්‍රකාශ කරයි.

.

වචන මාලාව

| | | |
|---|---|---|
| මම | - | நான் |
| ඔයා | - | நீங்க |
| අපි | - | நாம |
| පාසල | - | பாடசாலை |
| පන්තිය | - | வகுப்பு |
| පිට්ටනිය | - | மைதானம் |

**නිපුණතාව** 4.0 : පොදු සිදු විය හැකි සහ කාල්පනික අවස්ථා ගැන විවිධ භාෂා රටාවලින් යුක්ත කෙටි සරල වාක්‍ය ලියයි.

**නිපුණතා මට්ටම 4.2**: නිර්මාණාත්මක පාඨ ලියයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- තමා කැමති විනෝදාංශය නම් කරයි.
- තම විනෝදාංශ පිළිබඳ වාක්‍ය ලියයි.
- විනෝදාංශ පිළිබඳ නිර්මාණාත්මක පාඨ ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්** :

- පාඩමේ ඇතුළත් නිර්මාණාත්මක පාඨ ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණාත්මක පාඨ පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- පාඩම් කියවීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් වඩාත් කැමති විනෝදාංශය පිළිබඳ විමසන්න.
- එම විනෝදාංශ පිළබඳ නිර්මාණාත්මක ව ලිවීමේ අවස්ථාව ලබා දෙන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි අවධානය යොමු කරවන්න.
- අදාළ අභ්‍යාස හා ක්‍රියාකාරකම්හි නිරත කරවන්න.

**මූලික වදන්** :

- **මම කැමති විනෝදාංශ**

  විනෝදාංශය

  සත්තු

  කැමැති යි.

  ආස යි.

- **පුහුණුව සඳහා යොදා ගන්න**

| | |
|---|---|
| මම කැමති යි රූපවාහිනිය බලන්න. | මං ආස යි සින්දු කියන්න. |
| මම කැමතියි මුද්දර එකතු කරන්න. | මං ආස යි සෙල්ලම් කරන්න. |
| මම කැමති යි මල් වවන්න. | මං ආස යි නටන්න. |

**ගුණාත්මක යෙදවුම් :**

- පුවත් පතක පළ වූ විනෝදාංශ ගැන ලියවුණු ලිපියක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- තමා කැමති විනෝදාංශ කිහිපයක් ලියයි.
- විනෝදංශ පිළිබඳ නිර්මාණාත්මක ව ලියයි.
- නිර්මාණාත්මක ව ලිවීමට ඇති හැකියාව පිළිබඳ සතුට පළ කරයි.

වචන මාලාව

| | | |
|---|---|---|
| මම | - | நான் |
| ඔයා | - | நீங்க |
| අපි | - | நாம |
| පාසල | - | பாடசாலை |
| පන්තිය | - | வகுப்பு |
| පිට්ටනිය | - | மைதானம் |

**නිපුණතාව** 4.0 : පොදු සිදු විය හැකි සහ කාල්පනික අවස්ථා ගැන විවිධ භාෂා රටාවලින් යුක්ත කෙටි සරල වාක්‍ය ලියයි

**නිපුණතා මට්ටම** 4.3 : ලිපි ලියයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- සරල ලිපියක ආකෘතිය හඳුනා ගෙන ලියයි.
- පෞද්ගලික ලිපි ලිවීමේ හුරුව ලබයි.
- පෞද්ගලික ලිපි ලියයි.

**පාඩම සැලසුම කිරීම සඳහා උපදෙස් :**

- ආදර්ශ ලිපියක් ශිෂ්‍යයන්ට ඇසෙන සේ කියවන්න.
  (විෂය නිර්දේශයේ ඇති ලිපිය යොදාගත හැකි ය.)
- එහි ඇති සුවිශේෂ ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරන්න.
  යවන්නාගේ ලිපිනය
  ආශිර්වාදය
  ආමන්ත්‍රණය
  තොරතුරු
  අවසානය
- එම ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡා කරන අතරතුර පුවරුවේ ලියන්න.
- **මූලික වදන්** හා පුහුණුව සඳහා දී ඇති අභ්‍යාස කෙරෙහි අවධානය යොමු කරවන්න.
- මිතුරෙකුට හෝ ඥාතියෙකුට හෝ සරල ලිපියක් ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- පාඩමේ ඇති අභ්‍යාස සහ ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

**මූලික** වදන් :

- **ආචිචිට ලිපියක්**

  සෙත් වේවා.

  නිදුක් වේවා.

  නිරෝගි වේවා.

  තෙරුවන් සරණ යි.

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

සෙත් වේවා .
නිදුක් වේවා.
නිරෝගි වේවා.

ආචිචිට බුදු සරණ යි.
ආචිචිට තෙරුවන් සරණ යි.
ආචිචිට දෙවි පිහිට යි.

**ගුණාත්මක යෙදවුම්**

- සරල ලිපි කිහිපයක්
- සකසා ගත් ලිපියක ආකෘතියක්
- හිස්තැන් පිරවීම සඳහා සැකසූ පත්‍රිකා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- සරල ලිපියක මූලික ලක්ෂණ හඳුනා ගෙන ලියයි.
- එදිනෙදා ජීවිතයේ දී සරල ලිපි ලිවීමට සිදු වන බව පිළිගනියි.
- සරල ලිපි ලියයි.

වචන මාලාව

| | | |
|---|---|---|
| සෙත් වේවා. | - | நலமுண்டாகட்டும் |
| නිදුක් වො. | - | இன்பம் உண்டாகட்டும் |
| නිරෝගි වේවා. | - | சுகதேகியாகுக |
| තෙරුවන් සරණයි. | - | மும்மணிகள் ஆசி |

**නිපුණතාව** 4.0: පොදු සිදු විය හැකි සහ කාල්පනික අවස්ථා ගැන විවිධ භාෂා රටාවලින් යුක්ත කෙටි සරල වාක්‍ය ලියයි.

**නිපුණතා මට්ටම** 4.4: තොරතුරු සහිත පාඨ ලියයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- තොරතුරු හඳුනා ගෙන ලියයි.
- තොරතුරු ඇසුරින් සරල වාක්‍ය ලියයි.
- අවස්ථාවට ගැළපෙන පරිදි තොරතුරු ලියා දක්වයි.

**පාඩම සැලසුම කිරීම සඳහා උපදෙස්** :

- නත්තල් සීයා කෙනෙකුගේ වර්ණවත් පින්තූරයක් ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
- නත්තල් සීයාගේ චරිතය හා බැඳුණු පහත සඳහන් කරුණු ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
  **(රැවුල, ඇඳුම, තෑගි)**
- එම ලක්ෂණ ඉස්මතු වන සේ සරල පාඨ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරමින් ලියන්න.
  - රැවුල, සුදු යි.
  - ඇඳුම රතු යි.
  - තෑගි ගොඩ යි.
- ශිෂ්‍යයන්ට නිර්මාණාත්මක පාඨ ලිවීමට අවස්ථාව සලස්වන්න. පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- එම පාඨ ඇගයීමට ලක් කරමින් සාකච්ඡා කරන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- පාඩමට අදාළ අභ්‍යාස හා ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන්** :

- **නත්තල් උත්සවය**

| | |
|---|---|
| සහභාගී වීම. | ගොඩක් |
| රැවුල | හුඟක් |
| ඇඳුම | තෑගි |
| නත්තල් සීයා | සරසනවා. |
| නත්තල් ගස | දෙනවා. |

- **පුහුණුව සඳහා යොදා ගන්න**

| | |
|---|---|
| රැවුල ලස්සන යි. | අම්මා තෑගි දෙනවා. |
| ඇඳුම ලස්සන යි. | තාත්තා තෑගි දෙනවා. |
| මල්ල ලස්සන යි. | නත්තල් සීයා තෑගි දෙනවා. |

| | |
|---|---|
| ගෙදර සැරසුවා. | අම්මා තෑගි දුන්නා. |
| ගව ලෙන සැරසුවා. | තාත්තා තෑගි දුන්නා. |
| නත්තල් ගස සැරසුවා. | නත්තල් සීයා තෑගි දුන්නා. |

**ගුණාත්මක යෙදවුම් :**

- නත්තලා සීයාගේ වර්ණවත් පින්තූරයක්
- නත්තල් උත්සවයකට අදාළ පින්තූරයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- පින්තූර හඳුනා ගෙන අදාළ වචන ලියයි.
- පින්තූරවලට අදාළ තොරතුරු ලියයි.
- සරල තොරතුරු පාඨ ලියයි.

වචන මාලාව

| | | |
|---|---|---|
| නත්තල් උත්සවය | - | நத்தார் விழா |
| සහභාගී වීම | - | பங்குபற்றுதல் |
| රැවුල | - | தாடி |
| ඇඳුම | - | உடை |
| නත්තල් සීයා | - | நத்தார் தாத்தா |
| හුඟක් | - | மிகவும் |
| ගොඩක් | - | நிறைய |
| සරසනවා. | - | அலங்கரிக்கிறம் |
| දෙනවා. | - | தாரன் |